පහන් වැල්

නිර්මාණ ආර්චිය

නියගෙට කියන කවි

තල්මස් රංචු පොරකන පැසිපික් — සයුරේ
සිත් අස් වසන සුන්දර ඉන්දිය — ඉවුරේ
පෙම් බස් දොඩන මුහුදට දකුණේ — උතුරේ
ඇස් වස් වැදී නියගය ආවද — මිතුරේ

යොදුන් දිගැති ගොවි බිම් ගෝ — බිම් වතසා
රැහුන් බලැති නියගය ගති — රටම මවා
බුදුන් පුදම හිමි දෙසු දම — මෙම විදසා
රජුන් දැහැමි රට හිග නැත — වැසි වරුසා

නෙරපතිතම රටේ වැසියන් සිත — විකල
රඳවනි සරණ පතහාවුන් සිර — ගෙවල
එළැඟෙනි යුදට බොරු අවි සිය — කර පතල
අධර්මැති රජුට නියගය, නැත — වැසි සිසිල

තැස්මන් දුපතේඅසිරිය සුන් — කරෑති
ඉක්මන් තාසියට වැසි වන පෙත් — මරෑති
සත්සුන් රටා පරිසරයේ හොඳ — ගුණැති
දැන් දැන් අහෝ අප අතරින් — පලා යති

පුළසති හයිඩ්‍රෝ කාබන් රිසි — විලස
පුරවති වායු ගෝලය ධූමයෙන් — විස
පෙර නැති විරූ නියඟය රට — සතර දෙස
මොළ ඇති අයට වැටහෙනු ඇත — මේ වෙනස

ජගත් සමුළු වෙදිරැළු දුන් — කියොටෝවේ
උගත් මහැදුරන් පිළියම් — ගෙන ආවේ
රටත් වැසියනුත් ගිල්වා — ලප්ජාවේ
රෙදිත් ඇඳ ගෙනද ලෝකෙට — පිටුපෑවේ

රසික සූරියඅාරච්චි
(pemgee.blogspot.com)

මැද පෙරදිග සිට

නිසරු දිනයක අදරු දිදිංගැමි ලබන හඳවත තුලට — රිංගා
ඝනගතය ඇත ඔට ගඟනන ඔබගෙන ඔබමි ලිපියක — සතුට නංගා
ගොබැති දින ලිපි කතර තාපුළු නඟයි දසුවන කඳුලු — ගංගා
ලියමි ලිපියක නිරත සැඟවුන හැඟුම් හඳවත තුලම — ගංගා.

සතුට දනවන ඔබගි හසුනක එළන්නට අපසලු — ගෙරෙන්නෝ
හදේ ඝනගතය විසර්ජනයට ඕනට මගය ගිවිදුන් — දලන්නෝ
හැඟුම් ගෝපය දෙසට නංවා ශාමයෙ ඔබගෙ දොළු — නගන්නෝ
ඔබගෙ ලිපියක ලැගෙන තුරු මගේ ගෙගළඟ ඔබවෙත ගලි — ලියන්නෝ.

හදදමි ඝනගතය මෙතා ලුහදදන කඳුලු ගංගා — ගලාගැදදන්
හැඟුම් හඳවත දැවී දොම්කන මඟදු තබිකර — පලාගැදදන්
ඔබගෙ ලදු ලිපි කොඹෙහි එවා මම ඳදින වැළපෙමි විරහ — ලැදදන්
පෙනෙයි ගොදවී අතීතය ඔට මගේ විසයකන කඳුලු — මැදදෙන්.

විජයසිරි තිලකුමාර
ඕස්ලන්ත

පහන් වැට ට ලියන්න. සන්නස පහන් වැට කාව්‍ය නිර්මාණ විශේෂාංගයට ලැබෙන කවි අතරින් එක් කවියකට වටිනා ඩීවීඩී තැටියක් පිරිනැමීමට ඔස්ට්‍රේලියාව පුරා අවාහප් ඩීවීඩී තැටි බෙදාහරින DBSJ එන්ටර්ප්‍රයිස් සූදානම්

DBSJ Enterprise Tel/Fax 03 8336 1113

පිළිකාවට පැරදී සිටින මිතුරාණනි

ඔබ කෙරෙන් හිතුත් වන අභිංසක සෝකුරු බැල්ම
සෙනෙහසින් බර වූ - අප ගේ බැල්ම හා
ආහර මඟ දී ගැටී - පිපිරී සුණු විසුණු වී
අතුරුදහන් වී යෙයි.

ඇසට අසය නොදී අප - ඔබ හා සිනාසෙනු දොඩනු
කවර හෙයිනැස් දන්නා ඔබ - අහසට නෙත් යොමාගෙන
ඉරු සඳු හා දොළොන වීට - ඉකි ගසා හඬන සේ
දැනේ අප හදවත් හැම

පවසමීන් රළ පවත් - සිනා මසු මුතුණින්
සිටින ඔබ වීටින් වීට - බියෙන් තැති ගන්නේ
ගොරතර රුදුරු මරු - ඔබ හා සිනාසෙනු
දැක ලා වත් ද සබඳිනි?

තව දවස් සියයයි - තව අනු නවයයි
අවසන් ගමන් යන්නට - අපෙන් සමු ගන්නට
ඔබැසිලි ගණිය වීට - සුනාමී රළ පහර
වදී අප හදවත්වලට

අප එක එකා ගේ - ආවිසෙන් එක් මස බැගින්
ඇරැල ගෙන තව සිය වසක් - ඔබ ආවීසට එක් කරගෙන
ජීවත් වුව මැනවි - අප හා බැඳී සසැනැති
කළ මීතුරා...ණනි අපේ....

වී. ක. ධර්මබන්ධු

ප්‍රාර්ථනා

රැඩිර බිඳු බිඳු එළන්වලා
බිඳිදු කළසය විහිකලා
රැඩිර බිඳු බිඳු වෙන්වලා
ඕඩින ලෝකය සුන්කලා

සොරෙන් එරටත් පෙරාම් රිරැවී
යලිත් මේ ලෙස දුක් විඳින්නද?
මෙවැනි දසමය ලොවේ සැදුවේ
දෙවිඳ! මා නොමරා මරන්නද?

මෙහි තුරුලට නො-ආ බිඳිඳුකි
ඕඩිනයක නොම රැඳීයන
සැබෑ ලෝකය ඔබ දකින්නට
දිනක ඒ පිත ලැබීයන්

රසිකා පෙරේරා
ඕඩිනි

නුඹ පුරන පෙරාම් දම් ඇති වෙයිද?

සඳ හැසෙද මුළු මෙළ
දිස්සන ලෙයි හඳ ගැබට
ඔය දඳහතේ ලොබමයය
ගෙහේ අතඟෝ රැඳිද
මළ පොකුරු එඩාතේ
සුදු පිච්ච මළ පඳුර
නුඹ මරත් හැඟලාම
හිනාගඟය මා එක්ක

අප හමුව යෙන්ව ගිය
තුරු යෙහෙක ගැබ බිඳන්
රැළි ගැහගන ගං දියට
නුඹ ගීත ගැයුවාද
මළ දුලක හීනයට
ඉකිබිඳින හඳඹබව
තුරුලුවී සැනසෙන්ට
නුඹ සැසැදී පැතුවාද

යලි යලිත් මගය මතක
සිතේ සැසඳන්න හොකොටට
නුඹ එක්ක අරගවිරව
නුඹට දුක් දුන්නාදැ
විශරු මඟ පොළඹ මත
සුදුමි එබ්බ හිඳින්නට
නුඹ පුරන පෙරාම් දම්
ආතිරවෙදැ කිසිදාද?

බෝදිනි ර. ගමරතුංග

නැවතා නුඹව ලබන්නට

ආදරයේ දොරටු වසා
මනුෂ්‍ය බහට මුළා වෙලා
හීන නුඹේ බොඳ කරළා
ගියේ අන් සැපත සොයා

මා පැතුවට අන් සැපතක්
ඔබ නැතැ පැතුවේ එලෙසින්
නුඹගේ සිත විදෙවිවාට
ලබන්නෙමි පාපයේ සාපය

වෙන සැපතක් සොයා එපිට
මනුත් ගියා මා තනිකොට
තනිවූ කුටක මගෙ දිවියට
නුඹෙ සරණය නැවත
පතන්නට
තවත් වරක් නුඹව ලබන්නට
පතන්නෙමි මා අහස් වරකට

ප්‍රීසා කටුනායක

පිට්ටනිය

ක්‍රිකට්

ශ්‍රී ලංකා ක්‍රිකට් පිළට කලකට පසු ලැබුණ විවේක සමය දන් ගෙවී යමින් තිබේ. මේ මාසයේ දී බටහිර ඉන්දීය කොලදෙව් ක්‍රිකට් පිළ ශ්‍රී ලංකාවේ සංචාරයක නියැලීමට නියමිත අතර එහි දී මවුන් ටෙස්ට් තරග දෙකකට සහ ඉන්දියාවේ ද සහභාගිත්වයෙන් පැවැත්වෙන තුන්කොන් එක්දින තරගාවලියකට සහභාගි වීමට නියමිත ය.

මෙම ක්‍රිකට් තරගාවලිය උණුසුම් මුහුණුවරක් හඳ ඇති බවට දනටමත් මත පලවී තිබේ. පසුගිය කාල සීමාවේ බටහිර ඉන්දීය කොලදෙව් පිළ යළි දස්කම් අතරට පැමිණීමත්, ශ්‍රී ලංකා පිළ මවුබිමේ දී පරාජය කිරීමට අපහසු කණ්ඩායමක් විමත් යන කරුණු හේතුවෙන් මෙම තරගාවලිය උණුසුම් වනු ඇති බවට විචාරක යෝ මත පල කරති.

කෙසේ වෙතත් මෙම තරගාවලීන් සඳහා ඒ ඒ කණ්ඩායම්වල ප්‍රබල ක්‍රීඩකයන් රැසකගේ දායකත්වය අහිමි වන ලකුණු ද පනළ වී තිබේ. විශේෂයෙන් සුපිරි පිතිකරුවන් වන ලාරා හා ලාරා සහ සචින් තෙන්ඩුල්කාර් තුන්කොන් තරගාවලිය සඳහා සහභාගි වන්නෙන් නැත. ලාරා එක්දින තරගාවලිය සඳහා තෝරාගෙන නැති අතර සචින් ආබාධයකින් පෙළේ. කෙසේ වෙතත් ලාරා ටෙස්ට් තරගාවලිය සඳහා සහභාගි වනු ඇති බවට ද වාර්තා පළව තිබේ. මීට අමතරව ශ්‍රී ලංකා පිළේ නායක මාවන් අතපත්තු ද ආබාධයකට ලක්ව තිබේ. ඔහුගේ සහභාගීත්වය ද තවමත් අවිනිශ්චිත ය. මේ අනුව ප්‍රබල පිතිකරුවන් රැසකගේ පිතිකරණ රටාව නැරඹීමට ශ්‍රී ලාංකේය ක්‍රීඩා ලෝලීන්ට අවස්ථාව අහිමි වනු ඇත.

මෙම තරගාවලිය ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාවට තවත් අංශ ගණනාවකින් වැදගත් වේ. ශ්‍රී ලංකා පිළ මෙවර තරගාවලියට සහභාගි වන්නේ නව පුහුණුකරුවෙකු සමගිනි. ඒ ඕස්ට්‍රේලියානු ජාතික ටොම් මූඩි ය. මූඩි ශ්‍රී ලංකා පුහුණුකරුවා වීම සම්බන්ධයෙන් විවිධ අදහස් පළව තිබේ. සමහරු ඔහුගේ පත්වීම අනුමත කරති. එහෙත්, ඇතැම් පාර්ශ්ව වවසන්නේ රුපියල් ලක්ෂ 15 කට අධික මාසික වැටුපක් ගෙවමින් තවත් රුපියල් ලක්ෂයක ගණනාවකින් කන්සේරු කළ හැකි පහසුකම් ලබා දෙමින් මූඩිගේ සේවය ලබා ගැනීම අනුමත කළ නොහැකි කන්සලයක් බවයි. එම මුදලට මූඩිට වඩා හොඳ දේශීය පුහුණුකරුවන් කිහිප දෙනෙකු ම සම්බන්ධ කර ගැනීමට තිබූ බව ඔවුන්ගේ අදහසයි.

කෙසේ වෙතත් දේශීය පුහුණුකරුවන් සම්බන්ධ කර ගැනීම හරහා අභ්‍යන්තර ආරවුල් ඇතිවීම ශ්‍රී ලංකාව වැනි ආසියානු රටවල ක්‍රිකට් කණ්ඩායම්වල පොදු

30 වන පිටව

The West Indian squad to tour Sri Lanka

The West Indian board has decided to pick a second-string squad to tour Sri Lanka, leaving out a number of top players, including Brian Lara, Ramnaresh Sarwan and Chris Gayle, owing to the contracts dispute between the board and the West Indian Players Association

Xavier Marshall, Ryan Ramdass, Runako Morton, Shivnarine Chanderpaul (capt), Sylvester Joseph, Denesh Ramdin (wk), Narsingh Deonarine, Dwayne Smith, Daren Powell, Omari Banks, Kerry Jeremy, Deighton Butler, Tino Best, Jermaine Lawson

Fixtures

July	9-10	Tour Match	Colombo
	13-17	1st Test	Colombo (SSC)
	21-25	2nd Test	Kandy

Triangula ODI Series Sri lanka, India and West Indies

July		
30	Sri Lanka v India	Dambulla (D/N)
31	India v West Indies	Dambulla (D/N)
August		
2	Sri Lanka v West Indies	Dambulla (D/N)
3	Sri Lanka v India	Dambulla (D/N)
5	Rest/Reserve Day	
6	Sri Lanka v West Indies	R Premadasa (D/N)
6	Sri Lanka v West Indies	R Premadasa (D/N)
7	India v West Indies	R Premadasa (D/N)
8	Rest/Reserve Day	
9	Final R Premadasa (D/N)	
10	Rest/Reserve Day	

මැයි සහ ජූනි මාස දෙකේ පහන් තරුවට කවි ලියා මෙලේබඩ් හි DBSJ Enterprise වෙබ්ශේ DVD තැටි දෙකක් ලබන්නට වරම් ලද කවියන් දෙදෙනා

මැයි මාසය
රසික සූරියඅාරච්චි සිඩිනි
ජූනි මාසය
ලක්ෂ්මන් කොඩිතුවක්කු සිඩිනි